# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

(අධ්‍යාපන අමාත්‍යාංශය)

# පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමෝපාය සැලසුම්) ii ශ්‍රේණිය තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සේවා ගණය : කළමනාකාර සේවා ගණය**

**වැටුප් පරිමාණය :** MM 1-1 - 2016 රු: 53,175 - 10X1,375 - 15X1,910 - 95,575/= (මාසික)

**තනතුර :** සහකාර අධ්‍යක්ෂ (ක්‍රමෝපාය සැලසුම් ) ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

**සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය /වාණිජ්‍යය / ආර්ථික විද්‍යා විෂයයකින්) ලබා තිබීම

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන (03)ක පළපුරුද්දක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

   සහ

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන(03)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක

   අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නො අඩු හා අවු.45 ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**සේවා කොන්දේසි**

1. මෙම තනතුර ස්ථිර වන අතර, අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
2. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12%ක් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3%ක්ද ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා රාජකාරී ස්ථානය - කොළඹ**

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු, තම අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද ඇතුළත් කර අයදුම්පතට අදාළ සහතික වල පිටපත් ද සමඟ "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ - 07 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2022.05. 06 දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතුය.

ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,**
**අංක 14, නිදහස් මාවත කොළඹ 07.**

2022.04.25